# සංස්ථාපිත හා පුද්ගලික බදුකරණය

**විෂය අංකය : 304**

**2022/2023 තක්සේරු වර්ෂය සඳහා යාවත්කාලීන කිරීම්**

**වැදගත්:**

මෙම විෂය නිර්දේශය යටතේ ඉදිරියේ දී පැවැත්වීමට නියමිත විභාග සඳහා පරීක්ෂා කිරීමට නියමිත තක්සේරු වර්ෂ පහත පරිදි වේ.

| විභාගය | | තක්සේරු වර්ෂය (Y/A) |
|---|---|---|
| 2023 - ජූලි විභාගය | - | 2022/2023 |
| 2024 - ජනවාරි | - | 2022/2023 |

ප්‍රකාශනය:

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

**හිතවත් සිසුන් වෙත,**

304 සංස්ථාපිත හා පුද්ගලික බදුකරණය (CPT) විෂය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු ඔබේ අවධානය සඳහා වේ.

**2023 ජුලි සහ 2024 ජනවාරි විභාගයේදී සංස්ථාපිත හා පුද්ගලික බදුකරණය (CPT) විෂය සඳහා තක්සේරු වර්ෂය පරීක්ෂා කිරීම.**

2023 ජුලි විභාගය (අගෝස්තු මාසයේ පැවැත්වීමට නියමිත) සහ 2024 ජනවාරි විභාගය සඳහා තක්සේරු වර්ෂය වන්නේ 2022/2023 වේ. එම වෙනස්කම් 2023 ජනවාරි 1 වන දින සිට බලපැවැත්වෙන නමුත්, සිසුන්ගේ පහසුව සැලකිල්ලට ගනිමින් කාල සීමාව නොසලකා එම වෙනස්කම් මුළු වසර සඳහාම අදාළ වන ලෙස විභාගයේදී පරීක්ෂා කරනු ලැබේ.

**2023 ජුලි විභාගයේ සිට අනෙකුත් ව්‍යාපාර බදු යටතේ සමාජ ආරක්ෂණ බද්ද (SCL) පරීක්ෂා කිරීම**

2022 අංක 25 දරණ සමාජ ආරක්ෂණ බදු (SCL) පනත හඳුන්වා දෙන ලද අතර එය 2022 ඔක්තෝම්බර් 1 වන දින සිට බලපැවැත්වේ, ඒ අනුව සමාජ ආරක්ෂණ බද්ද (SCL) අනෙකුත් ව්‍යාපාර බදු පරිච්ඡේදය යටතේ 2023 ජුලි විභාගයේදී පරීක්ෂා කරනු ලැබේ.

| 01 වන පරිච්ඡේදය | ශ්‍රී ලංකාවේ බදුකරණය හැඳින්වීම |
|---|---|

- 9 පිටුව -

## 1.5.1 ආදායම් බදු ගෙවීමට යටත් වන්නේ කවරකු ද?

*පහත පරිදි උදාහරණය එක් විය යුතුයි.*

- නේවාසික සමාගමක් විසින් රඳවා ගැනීමේ ගෙවීමට යටත්ව ගෙවනු ලබන ලාභාංශ

| 02 වන පරිච්ඡේදය | ආදායම් මූලාශ්‍ර |
|---|---|

- 21 පිටුව -

## 2.1.3 ප්‍රතිලාභවල වටිනාකම

*පහත කොටස ඉවත් විය යුතුයි.*

2. සේවායෝජකයා විසින් සපයනු ලබන ඕනෑම නිවාසයක වටිනාකම

(i) සේවායෝජකයා විසින් සපයනු ලබන ඕනෑම නේවාසික ස්ථානයක වටිනාකම ලෙස අවස්ථානුකූලව වෙළෙඳපොළ වටිනාකම විය යුතු අතර **වෙළෙඳපොළ වටිනාකම නිශ්චය කරගත නොහැකි අවස්ථාවක** නිවාස ප්‍රතිලාභය ලෙස පහත දැක්වෙන වටිනාකම් සැලකිය යුතුය.

*පහත වගුව සංශෝධනය විය යුතුයි.*

2. සේවායෝජකයා විසින් සපයනු ලබන ඕනෑම නිවාසයක වටිනාකම

| විස්තරය | මාසික මූල්‍ය නොවන ප්‍රතිලාභය (රු.) | | |
|---|---|---|---|
| | වරිපනම් බදුවලට යටත් ප්‍රදේශ | වරිපනම් බදුවලට යටත් නොවන ප්‍රදේශ | වතු බංගලා |
| සේවායෝජකයා විසින් සපයනු ලබන නිවස | අදාළ මාසයේ වේතනයෙන් 12.5% | අදාළ මාසයේ වේතනයෙන් 10% | අදාළ මාසයේ වේතනයෙන් 7.5% |

- 22 පිටුව -

3. සේවායෝජකයා විසින් සපයනු ලබන ප්‍රවාහන පහසුකම්වල වටිනාකම

*පහත කොටස ඉවත් විය යුතුයි.*

(i) සේවායෝජකයකු විසින් සේවා නියුක්තිකයකුට ලබාදුන් කිසියම් මෝටර් රථයක් (පූර්ණ හෝ අර්ධ වශයෙන්) පුද්ගලික භාවිතය සඳහා යොදාගන්නා විට එහි වෙළෙඳපොළ වටිනාකම සේවා නියුක්ත ප්‍රතිලාභය ලෙස සැලකිය යුතුය. යම් අවස්ථාවක වෙළෙඳපොළ වටිනාකම නිශ්චය කළ නොහැකි නම් පහත දැක්වෙන වටිනාකම් ප්‍රතිලාභයේ වටිනාකම ලෙස සැලකිය යුතුය.

*වගුව පහත පරිදි සංශෝධනය කර ඇත.*

| වාහන වර්ගය | මාසික මූල්‍ය නොවන ප්‍රතිලාභ වටිනාකම (රු.) | | |
|---|---|---|---|
| | වාහනය | රියදුරු | ඉන්ධන |
| ඕනෑම වාහනයක් | 20,000 | 10,000 | 20,000 |

*පහත කරුණ සංශෝධනය කර ඇත.*

4. සේවායෝජකයා විසින් සපයනු ලබන සන්නිවේදන පහසුකම්වල ගණනය කිරීම

රජය විසින් නිකුත් කරන ලද කිසියම් චක්‍රලේඛයක්, විධානයක් හෝ රෙගුලාසියක් යටතේ සන්නිවේදන පහසුකම් සඳහා ගෙවීමක් ලැබීමට ඕනෑම සේවකයෙකුට හිමිකම් ඇති අවස්ථාවක, එම ගෙවීම සඳහා සේවා යෝජකයා දරන වියදමෙන් 25% ක් සේවකයාට ලැබෙන ප්‍රතිලාභයේ වටිනාකම විය යුතුය.

*වගුවෙහි පහත කරුණු සංශෝධනය කර ඇත.*

5. සේවායෝජකයා විසින් සපයනු ලබන අනෙකුත් ප්‍රතිලාභ

| ප්‍රතිලාභයේ ස්වභාවය | ප්‍රතිලාභ වටිනාකම |
|---|---|
| සහනදායී අනුපාතයක් යටතේ ලබාදෙන ණය | 0% පිරිවැය |

**- 24 පිටුව -**

## 2.1.7 විශ්‍රාම ප්‍රතිලාභ

*පහත කරුණු සංශෝධනය කර ඇත.*

සේවකයෙකු විශ්‍රාම යෑමේදී ඇතැම් එකවර ලැබීම් සේවා නියුක්තියෙන් ලැබෙන ලාභයට ඇතුළත් වේ. සේවකයා විශ්‍රාම ගන්නා අවස්ථාවේදී ලැබුණු සහ කලින් තක්සේරු වර්ෂයකදී බදු අයකර ඇති ඕනෑම විශ්‍රාම වැටුප් ගෙවීමක් රැකියාවෙන් ලාභය ගණනය කිරීමේදී විය යුතුය.

**- 31 පිටුව -**

## 2.2.5.1 සාමාන්‍ය අඩු කිරීම් (10 වැනි වගන්තිය)

**සාමාන්‍ය රීතීන්,**

*පහත කරුණු සංශෝධනය කර ඇත.*

2. යම් ගෙවීමකින් රඳවා ගැනීමේ බදු අඩු කළ යුතු අවස්ථාවක, රඳවා ගන්නා ලද බද්ද කොමසාරිස් ජනරාල් වෙත ගෙවන තෙක් අදාළ ගෙවීම අඩු කිරීමට ඉඩදෙනු නොලැබේ.

- ✓ පොලී හෝ වට්ටම් ගෙවීම – 5%
- ✓ සමස්ථ ගෙවීම වසකට රු. 100,000 ක් හෝ ඊට වැඩි නේවාසික පුද්ගලයෙකුට කරන කුලී ගෙවීම, සම්පූර්ණ මුදලින් 10%
- ✓ ලාභාංශ හැර අනෙකුත් සියලු ගෙවීම් - 14% (ගාස්තු, ස්වභාවික සම්පත් ගෙවීම, රාජ්‍යභාග, අඩිමිල)
- ✓ ගෙවන්නාගේ සේවකයෙකු නොවන නේවාසික පුද්ගලයෙකු ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයක් සමඟ සේවා ගාස්තුවක් ගෙවනු ලබයි නම් ගෙවන පුද්ගලයා විසින් 5% රඳවා ගැනීමේ බද්දක් රඳවා ගත යුතු වේ.
    - ✓ විභාග ඉගැන්වීම්, දේශන පැවැත්වීම, පරීක්ෂා කිරීම, විමර්ශණය කිරීම හෝ අධීක්ෂණය කිරීම සඳහා
    - ✓ නේවාසික රක්ෂණයකට කොමිස් හෝ තැරැව් ගාස්තු ලෙස, විකුණුම් හෝ කැන්වසින් නියෝජිතයෙකුට
    - ✓ වෛද්‍ය, ඉංජිනේරු, ගණකාධිකාරී, නීතිඥ, මාදුකාංග සංවර්ධක, පර්යේෂක, ශාස්ත්‍රීය හෝ ඕනෑම පුද්ගල සේවා සපයන්නා නියම කළ හැකි පරිදි, එවැනි ස්වාධීන සේවා සපයන්නෙකු ගේ ධාරිතාවයෙන් පුද්ගලයෙකු විසින් සපයනු ලබන සේවාවන් සඳහා.

(කෙසේ වෙතත්, මසකට රු. 100,000 නොඉක්මවන සේවා ගෙවීමක් සඳහා අඩු කිරීමට අදාළ නොවේ)

**- 39 පිටුව -**

## 2.2.5.4.7 වැඩිදියුණු කිරීම - (14 වන වගන්තිය)

*පහත කරුණු සංශෝධනය කර ඇත.*

නමුත්, අඩු කළ හැකි ප්‍රමාණය පහත සීමාවන් නොඉක්ම වේ.

පහත වර්ගකර ඇති වත්කම් සඳහා

- 4 වන පන්තියේ වත්කම් එනම්, ගොඩනැගිලි, ව්‍යුහයන් සහ ක්ෂය කළ හැකි ඒ හා සමාන - සමානව තක්සේරු වර්ෂ 12 තුළ
- අනෙකුත් සියලු ක්ෂය කළ හැකි වත්කම් - සමානව තක්සේරු වර්ෂ 3 තුළ

**- 41 පිටුව -**

## 2.2.5.4.9 ව්‍යාපාර හෝ ආයෝජන පාඩු (19 වගන්තිය)

### පාඩු අඩු කිරීමේ රීති

*3 හි (අ) කොටස පහත පරිදි සංශෝධනය කර ඇත.*

(අ) යම් පුද්ගලයෙකු අලාභයක් ලබා ඇති අවස්ථාවක, ලාභයක් වූයේ නම් අඩු අනුපාතයකින් බදු අයකළ හැකි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් සහ පසුව එම අනුපාතය වැඩිකළ විට, එම පාඩුව අඩු අනුපාතයකින් බදු ගෙවිය යුතු යැයි නොසැලකේ.

*4 සඳහා පහත කොටස එක් කර ඇත.*

**4.** ආයෝජනය මගින් හිලව් නොකළ පාඩු අඩු කළ යුත්තේ, එවැනි පාඩු සිදු වූ තක්සේරු වර්ෂයෙන් වහාම එළඹෙන තක්සේරු වර්ෂයේ පළමු දින සිට ආරම්භ වන තක්සේරු වර්ෂ 6 ක් ඇතුළත පමණි.

**- 42 පිටුව -**

## 2.2.5.4.10 අලෙවිකරණ සහ සන්නිවේදන වියදම්

*පහත කොටස ඡේදය අවසානයට එක් කර ඇත.*

2021 අප්‍රේල් 01 දින සිට ආරම්භ වන අලෙවිකරණ සහ සන්නිවේදන වියදම් සඳහා අමතර 100% අඩු කිරීමක් වසර 3 ක සිට වසර 2 ක ට අඩු වී ඇති අතර එය 2023/2024 තක්සේරු වර්ෂයෙන් අවසන් වේ.

**- 44 - 45 පිටු -**

## 2.3.1 ලාභාංශ (Dividend)

### අවසාන රඳවා ගැනීමේ ගෙවීම්

*පහත කොටස පහත පරිදි සංශෝධනය විය යුතුය.*

**2021 අංක 10 දරණ ආදායම් බදු (සංශෝධන) පනත අනුව, පහත ලාභාංශ 2020.01.01 දින සිට බදු නිදහස් වේ.**

- නේවාසික සමාගමක් විසින් සාමාජිකයෙකුට ගෙවන ලබන ලාභාංශයක්, එවැනි ලාභාංශ ගෙවීමක් එම නේවාසික සමාගමට ලැබෙන වෙනත් ලාභාංශයක් හෝ 84A වගන්තියේ (1A) උප වගන්තියේ ආදායම් බද්දට යටත් වන වෙනත් සමාගමකට ආරෝපණය කළ හැකි හෝ ව්‍යුත්පන්න වේ.

**- 59 පිටු -**

*පහත කොටස ඉවත් කර ඇත.*

- නිර්වාසික තැනැත්තෙකු වන සාමාජිකයෙකුට වාසික සමාගමක් විසින් ගෙවනු ලබන ලාභාංශ,

## 2.3.2 පොලිය (Interest)

*පහත කොටස එක් කර ඇත.*

2023.01.01 සිට අත්තිකාරම් ආදායම් බද්දක් ලෙස පොලී ගෙවීම මත 5% ක් අඩු කළ යුතුය.

**- 46 පිටුව -**

*පහත කොටස් ඉවත් කර ඇත.*

**අවසාන රඳවා ගැනීමේ ගෙවීම් (2019.12.31 දක්වා අදාළ වේ.)**

1. රු. 1,500,000/-ක් දක්වා ජ්‍යෙෂ්ඨ පුරවැසියකුට ගෙවන පොලිය හැර වාසික පුද්ගලයකු වෙත ගෙවනු ලබන පොලිය
2. පුණ්‍යායතනයක් වෙත ගෙවන ලද පොලිය

**පස්වන උපලේඛනය යටතේ සහන (2019.12.31 දක්වා අදාළ වේ.)**

ජ්‍යෙෂ්ඨ පුරවැසියකු වන පුද්ගලයකු සඳහා එක් එක් තක්සේරු වර්ෂයක් සඳහා රු. 1,500,000/- දක්වා මූල්‍ය ආයතනයකින් ලැබෙන පොලිය

**- 48 පිටුව -**

## 2.3.10 ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන ලාභ (ප්‍රාග්ධන ලාභ)

*පහත කොටස පහත පරිදි සංශෝධනය කර ඇත.*

ආදායම් බදු කාර්යයන් සඳහා ප්‍රාග්ධන ලාභ ආයෝජන ආදායමක් ලෙස සැලකේ. ඒ අනුව **ආයෝජන වත්කම්** උපලබ්ධි කිරීමෙන් ඇතිවන ලාභ ප්‍රාග්ධන ලාභ වන අතර ඒ මත 10%ක අනුපාතය අදාළ වේ. 2022.10.01 දින සිට සමාගම් සඳහා 30% ක බදු අනුපාතය අදාළ කරගත යුතුය.

| 03 වන පරිච්ඡේදය | වාසික පුද්ගලයන් සහ සමාගම් සඳහා බදුකරණය |
|---|---|

**- 57 පිටුව -**

## 3.2.2 සුදුසුකම් ලබන ගෙවීම් සඳහා අදාළ වන සීමාවන්

*පහත කොටස පහත පරිදි සංශෝධනය කර ඇත.*

**පුද්ගලික සහන**

a. 2020.01.01 දින හෝ ඉන් පසු ආරම්භවන එක් එක් තක්සේරු වර්ෂය සඳහා භාරකරුවකු, භාර ගැනුම්කරුවකු, පොල්මඃකරුවකු හෝ ඈවරකරුවකු නොවන තනි පුද්ගලයකු හට එක් තක්සේරු වර්ෂයකට **රු. 1,200,000/-.**

*පහත කොටස් ඉවත් කර ඇත.*

b. **සේවා නියුක්ති ආදායම මත සහන (2019.12.31 දක්වා වලංගු වේ)**

සේවා නියුක්ති ආදායමක් සහිත පුද්ගලයකු නම්, ඔහුගේ මුළු සේවා නියුක්ති ආදායම දක්වා **රු. 700,000/-** ක දීමනාවකට හිමිකම් ලබයි.,

**- 57- 58 පිටු -**

f. 2020.01.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි වාසික පුද්ගලයකුගේ ආදායම් බද්ද ගණනය කිරීමේදී තක්සේරු වර්ෂය තුළදී දරන ලද පහත සඳහන් වියදම්වල එකතුව රු. 1,200,000 දක්වා අඩු කරගත හැක.

- වෛද්‍ය රක්ෂණ සඳහා දායක ඇතුළුව සෞඛ්‍ය වියදම්

- යම් පුද්ගලයකු හෝ ඔහුගේ දරුවන් වෙනුවෙන් දේශීයව දරන ලද වෘත්තීය අධ්‍යාපන හෝ වෙනත් අධ්‍යාපන වියදම්
- නිවාස ණය සඳහා පොලී ගෙවීම්
- අනුමත දේශීය විශ්‍රාම ක්‍රමයකට සේවකයකු ගෙවන ලද දායක මුදල්
- කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කොටස් හෝ වෙනත් යම් මූල්‍ය සාධන පත්‍ර මිල දී ගැනීම සඳහා හෝ භාණ්ඩාගාර බැඳුම්කර හෝ භාණ්ඩාගාර බිල්පත් මිල දී ගැනීම සඳහා දරන ලද වියදම්
- ස්වකීය පරිශ්‍රයෙහි සවි කිරීම පිණිස සූර්ය පැනල අත්කර ගෙන එය ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කරන ලද වාසික පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට, ඒ සූර්ය පැනල සඳහා වූ සම්පූර්ණ වියදම තෙක් හෝ ඒ සූර්ය පැනල අත්කර ගැනීමට ලබා ගත් යම් ණය මුදලක් සම්බන්ධයෙන් බැංකුවකට ගෙවන ලද මුදල් ප්‍රමාණය තෙක්, එක් එක් තක්සේරු වර්ෂය සඳහා රු. 600,000

**- 58 පිටුව -**

*පිළිතුරු 1 - පහත පරිදි සංශෝධනය කර ඇත.*

පුද්ගලික සහනය හිලව් කිරීම සඳහා පෙරේරා මහතා හිමිකම් ලබන්නේ රු. 2,400,000/-ක ව්‍යාපාර ආදායම සඳහා පමණක් වන අතර රු. 600,000/- ක් වන ආයෝජන ආදායමට හිලව් කළ නොහැකිය. ඒ අනුව, ඔහුගේ බදු අය වන ආදායම රු. 1,800,000/- ක් (600,000 + 2,400,000 - 1,200,000) වේ.

**- 59 පිටුව -**

*පිළිතුරු 3 - පහත පරිදි සංශෝධනය කර ඇත.*

| | | |
|---|---|---|
| සේවා නියුක්ති ආදායම | රු. | 3,500,000 |
| අඩු කළා: මූලික සහනය | රු. | (1,200,000) |
| බදු අය කළ හැකි ආදායම | රු. | 2,300,000 |

**- 60 පිටුව -**

### 3.3.1.1 වාසික සහ නිර්වාසික පුද්ගලයන් සඳහා වූ බදු අනුප්‍රමාණ

*බදු අනුපාතයන් පහත පරිදි සංශෝධනය විය යුතුය.*

(2023.01.01 දින සිට තනි පුද්ගලයන්ට පහත බදු අනුපාත අදාළ වේ.)

| බදු අය කළ වන ආදායම | අනුපාත |
|---|---|
| පළමු රු. 500,000 | 6% |
| ඊ ළඟ රු. 500,000 | 12% |
| ඊ ළඟ රු. 500,000 | 18% |
| ඊ ළඟ රු. 500,000 | 24% |
| ඊ ළඟ රු. 500,000 | 30% |
| ඉතිරිය | 36% |

**- 61 - 62 පිටු -**

*පහත කොටස් සම්පූර්ණයෙන් සංශෝධනය කර ඇත.*

## 3.3.4 සමාගම් සඳහා අදාළ වන බදු අනුප්‍රමාණ (පළමු උපලේඛනය)

2022.10.01 දින සිට පහත සඳහන් අනුපාත සමාගම් සඳහා අදාළ වේ. (සහනදායී අනුපාත / අඩු අනුපාත ඉවත් විය යුතුයි.)

| ලැබීම් සහ ලාභ වලින් | 2022.09.30 දක්වා | 2022.10.01 සිට |
|---|---|---|
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) | 14% | 30% |
| විදේශ මුදල් වලින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණ ලැබෙන භාණ්ඩ අපනයනය කිරීම | 14% | 30% |
| නිශ්චිත ව්‍යවසායක | 14% | 30% |
| අධ්‍යාපන සේවා සැපයීම | 14% | 30% |
| සංචාරක ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ව්‍යවසාය | 14% | 30% |
| ඉදිකිරීම් සේවා සැපයීම | 14% | 30% |
| කෘෂි පිරිසැකසුම් | 14% | 30% |
| සෞඛ්‍ය රැකවරණ සේවා සැපයීම | 14% | 30% |
| වාසික සමාගමකින් ලද ලාභාංශ වලින් ලැබීම | 14% | 30% |
| මැණික් හෝ ස්වර්ණාභරණ සම්බන්ධයෙන් ලැබුණු ප්‍රතිෂ්ඨාව | 14% | 30% |
| විවිධ රාජ්‍ය ආයතන සඳහා සෞඛ්‍ය ආරක්ෂණ උපකරණ සැපයීමෙන් BOI සමග ලියාපදිංචි අපනයන සමාගම | 14% | 30% |
| පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් භාවිතා කරමින් නිපදවන ලබන විදුලිය ජාතික විදුලිබල පද්ධතියට සැපයීමෙන් ලබන ලැබීම සහ ලාභ | 14% | 30% |
| නිෂ්පාදනය | 18% | 30% |
| ඔට්ටු ඇල්ලීම හා සූදු පැවැත්වීම | 40% | 40% |
| ඕනෑම මත්පැන් හෝ දුම්වැටි නිෂ්පාදනය, විකිණීම සහ ආනයනය | 40% | 40% |
| අනෙකුත් ව්‍යාපාර | 24% | 30% |

*පහත කොටස අලුතෙන් එක් කර ඇත.*

(2) ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබීම් (ප්‍රාග්ධන ලාභ)
- එම ලාභ 30% ක බදු අනුපාතයක බද්දට යටත් වේ.

**- 67 - 68 පිටු -**

## 3.6.1 නිදහස් ආදායම් (තුන්වන උපලේඛනය)

*පහත කොටස් ඉවත් කර ඇත.*

h.

II 2021 අංක 10 දේශීය ආදායම් (සංශෝධිත) පනත අනුව, 2021.04.01 වන දින සිට, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර දී ඇති කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත ඉඩකඩම් දේපළ පිළිබඳ ආයෝජන භාරයකට විකුණන ලද, හුවමාරු කරන ලද හෝ මාරු කරන ලද ඉඩම් හෝ ගොඩනැගිලි උපලබ්ධි කිරීමෙන් 2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව යම් තැනැත්තකුට ලැබුණු ලැබීමක්

**- 70 පිටුව -**

u.

(ii) නියම කළ තොරතුරු තාක්ෂණ සහ සඵල සේවා සැපයීමෙන් (2021.06.29 දිනැති 2234/6 ගැසට් නිවේදනය)

(v) තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව සංකල්පය (ඔඩෑඔ) යටතේ ප්‍රමිතිගත කර ඇති සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියාමනය කරනු ලබන යම් වෘත්තීය අධ්‍යාපන ආයතනයක, යම් වෘත්තීය අධ්‍යාපන වැඩසටහන්වලින් -

(අ) ඒ තක්සේරු වර්ෂයට පෙරාතුව ම වූ තක්සේරු වර්ෂය තුළ ඒ ආයතනය විසින් වෘත්තීය අධ්‍යාපන වැඩසටහන්වලට බඳවාගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව හා සසඳනු ලබන විට, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ ආයතනය විසින් ඒ වැඩසටහන් සඳහා බඳවා ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව දෙගුණයක් කර තිබේ නම්

(ආ) 2021 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වසර පහක කාලසීමාවක් සඳහා, ඒ තැනැත්තාට ලැබුණු හෝ ඒ තැනැත්තා විසින් උපයන ලද ලැබීම් සහ ලාභ

එසේ වුව ද, (අ) ඡේදයේ කාර්යය සඳහා, පළමු වර්ෂය සඳහා විධිවිධාන සලසා ඇති පරිදි වෘත්තීය අධ්‍යාපන වැඩසටහනවීලට සිසුන් බඳවා ගැනීම දෙගුණ කර ඇති සහ පළමු වර්ෂයේ දී ඒ වැඩසටහන්වලට බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව ඉදිරි වර්ෂ හතර සඳහා ද පවත්වාගෙන ගොස් ඇති යම් ආයතනයක්, ඒ වර්ෂ තුළ එකී අවශ්‍යතාවය සපුරන ලද ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු ය

(vi) 2021 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, රත්‍රන්, මැණික් හෝ ස්වර්ණාභරණ අපනයනය කිරීමේ ව්‍යාපාරයකින් හෝ මැණික් ශ්‍රී ලංකාවට ගෙනැවිත් ඒ මැණික් කපා ඔපදමා අපනයනය කිරීමේ ව්‍යාපාරයකින් විදේශීය ව්‍යවහාර මුදලකින් උපයන ලද ලැබීම් සහ ලාභ බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරන්නේ නම්, ඒ තැනැත්තාට ලැබුණු හෝ ඒ තැනැත්තා විසින් උපයන ලද ඒ ලැබීම් සහ ලාභ

**- 72 පිටුව -**

## 3.6.2 අවසාන රඳවාගැනීමේ ගෙවීම්

2023.01.01 වන දින සිට පවත්නා අවසාන රඳවා ගැනීමේ ගෙවීම් පහත දැක්වේ.

*පහත කොටස (d) ලෙස එක් කර ඇත.*

(d) වාසික සමාගමක් විසින් ලාභාංශ ගෙවීම් (බදු අනුපාත 15%)

**- 74 පිටුව -**

***පිළිතුර 6 පහත පරිදි සංශෝධනය කර ඇත.***

| | |
|---|---|
| | **රු.** |
| සේවා නියුක්තික ආදායම | 2,000,000 |
| ව්‍යාපාර ආදායම | 1,300,000 |
| ආයෝජන ආදායම | 200,000 |
| **තක්සේරු කළ හැකි ආදායම** | **3,500,000** |
| අඩුකළා : සහන | |
| පුද්ගල සහනය | (1,200,000) |
| **බදු අය කළ හැකි ආදායම** | **2,300,000** |

**- 75 පිටුව -**

*පිළිතුරු 7 - පහත පරිදි වෙනස් විය යුතුය.*

| | සටහන් අංකය | රු. | රු. |
|---|---|---|---|
| සේවා නියුක්තික ආදායම | 01 | | 3,740,000 |
| ආයෝජන ආදායම | 02 | | 1,099,000 |
| දරුවාගේ ආදායම - වෙනමම තක්සේරු කළ යුතුය. | | | - |
| තක්සේරු කළ හැකි ආදායම | | | 4,839,000 |
| **අඩු කළා - සහන** | | | |
| පුද්ගල සහන | | 1,200,000 | |
| කුලී ආදායම මත සහනය (600,000x25%) | | 150,000 | (1,350,000) |
| | | | |
| **සුදුසුකම් ලබන ගෙවීම්** | | | |
| ජාතික වකුගඩු අරමුදලට මුදල් පරිත්‍යාග | | | (100,000) |
| ගමේ පන්සලට මුදල් පරිත්‍යාග - අඩු කළ නොහැක | | | - |
| **බදු අය කළ හැකි ආදායම** | | | 3,389,000 |
| පළමු 500,000 x 6% | | 30,000 | |
| ඊළඟ 500,000 x 12% | | 60,000 | |
| ඊළඟ 500,000 x 18% | | 90,000 | |
| ඊළඟ 500,000 x 24% | | 120,000 | |
| ඊළඟ 500,000 x 30% | | 150,000 | |
| ඉතිරි 889,000 x 36% | | 320,000 | 770,040 |
| **අඩුකළා -** බදු බැර | | | |
| APIT | | 45,000 | |
| වාරික ගෙවීම | | 10,000 | (55,000) |
| **ගෙවිය යුතු ඉතිරි බද්ද** | | | **715,040** |
| | | | |

**-Page 83-**

*පිළිතුරු 8 - පහත ගණනය කිරීම් පහත පරිදි වෙනස් විය යුතුය.*

| | | | | |
|---|---|---|---|---|
| බදු වගකීම<br>ව්‍යාපාර ආදායම - | 15,682,000 x 18% | | | 5,550,600 |
| | | | | |
| **අඩු කළා :** බදු බැර | | | | - |
| **ගෙවිය යුතු ඉතිරි බද්ද** | | | | **5,550,600** |

| 04 වන පරිච්ඡේදය | විවිධ ව්‍යවසායන් මත බදුකරණය |
| --- | --- |

- 92 පිටුව -

## 4.4 රාජ්‍ය නොවන සංවිධාන (NGO)

*පහත කොටස පහත පරිදි සංශෝධනය කර ඇත.*

- 68 වැනි වගන්තිය අනුව රාජ්‍ය නොවන සංවිධානයක් විසින්, යම් තක්සේරු වර්ෂයක් තුළ දී ප්‍රදාන, පරිත්‍යාග, දායක මුදල් හෝ වෙනත් යම් ආකාරයකින් ලැබුණු මුදල්වලින් 3% ක් මත 30% බැගින් බද්දක් ගෙවිය යුතුය. (2022.10.01 දින සිට)
- ඉහත දැවලට අමතරව රාජ්‍ය නොවන සංවිධානයක බදු අය කළ නොහැකි ආදායමක් වේ නම් ඒ මත 30%ක අනුප්‍රමාණයකින් බදු ගෙවිය යුතුය. (2022.10.01 සිට)

- 95 පිටුව -

*පිළිතුරු 3 - පහත පරිදි සංශෝධනය කර ඇත.*

| | | |
| --- | --- | --- |
| පරිත්‍යාග මත බදුවන ලාභ (රු. 3,000,000 × 3%) | රු. | 90,000 |
| ආයෝජන ආදායම - පොලිය | රු. | 350,000 |
| වර්ෂය සඳහා බදුවන ආදායම | රු. | 440,000 |
| බදුවන ආදායම මත බද්ද (30%) | රු. | **132,000** |

| 05 වන පරිච්ඡේදය | බැඳීම් හා ක්‍රියාපටිපාටි |
| --- | --- |

- 99 පිටුව -

### 5.1.1.2 බදු වාරික ගණනය කළ යුත්තේ කෙසේ ද?

*පහත කොටස අවසානයට එක් කර ඇත.*

- 2022 අප්‍රේල් 01 දිනෙන් ඇරඹෙන තක්සේරු වර්ෂය සඳහා පුද්ගලයෙකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද, පළමු මාස 6 සහ දෙවන මාස 6 ලෙස කාලපරිච්ඡේද 2 ක් ලෙස ගැති අනුපාත පදනම මත ගණනය කළ යුතුය.

- 101 පිටුව -

### 5.2.1.1 ආදායම් වාර්තාව ඉදිරිපත් කළ යුත්තේ කවුරුන් ද?

*පහත කොටස පහත පරිදි සංශෝධනය කර ඇත.*

(1) (i)

(ii) 83A වගනිත්ය යටතේ සේවා යෝජකයා විසින් තක්සේරු වර්ෂය සඳහා APIT අඩු කර ඇති රැකියාවෙන් පමණක් ආදායම ඇති පුද්ගලයෙකු විසින් ස්ව-තක්සේරුව යටතේ තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාවක් ගොනු කිරීම අවශ්‍ය නොවේ.

- 105 පිටුව -

## 5.3.5 කාල කඩඉම් ප්‍රතිපාදන (135 වගන්තිය)

*පහත කොටස පහත පරිදි සංශෝධනය කර ඇත.*

- වෙනත් යම් අවස්ථාවක දී,
  - i.
  - ii. වෙනත් තක්සේරුවක් සම්බන්ධයෙන් වන විට, තක්සේරු දැන්වීම බදු ගෙවන්නාට භාරදුන් දිනයෙන් මාස 12ක් ඇතුළත

සංශෝධිත / අතිරේක තක්සේරුවක් නිකුත් කළ හැකිය.

**- 106 පිටුව -**

## 5.4.2 පරිපාලන සමාලෝචනය (139 වගන්තිය) [Administrative Review]

*පහත කොටස පහත පරිදි සංශෝධනය කර ඇත.*

- එම තීරණය බදු ගෙවන්නාට දැනුම් දීමෙන් **දින 14ක් ඇතුළත සමාලෝචනය සඳහා ඉල්ලීම ලිඛිතව** කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කළ හැකිය. (2023.04.01 දින සිට)

| 06 වන පරිච්ඡේදය | රඳවා ගැනීමේ බදු සහ ප්‍රාග්ධන ලාභ බද්ද හා බදුකරණයට අදාල නඩු තීන්දු |
|---|---|

**- 118 පිටුව -**

### 6.1.2.1.1 අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (Advance Personal Income Tax - APIT)

*පහත කොටස පහත පරිදි සංශෝධනය කර ඇත.*

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සේවා යෝජකයන් වෙත නිකුත් කරන ලද මාර්ගෝපදේශය අනුව, සෑම සේවා යෝජකයකුම ආදායම් බදු ගෙවීමට යටත්වන එක් එක් සේවකයාගේ සේවා නියුක්තික ලාභ සහ ලැබීම් වලින්, ඔහුගේ පාරිශ්‍රමික ගෙවන හෝ බැර කරන අවස්ථාවේදී ආදායම් බදු අඩු කිරීම අවශ්‍ය වේ.

**- 120 පිටුව -**

### 6.1.2.2 ආයෝජන ප්‍රතිලාභවලින් (84 හා 84A වගන්ති) සහ සේවා ගාස්තු වලින් (85 වගන්තිය) බද්ද රඳවා ගැනීම.

*පහත කොටස් පහත පරිදි එක් කර ඇත.*

පහත ගෙවීම්වලින් ගෙවීම් කරන අවස්ථාවේ දී අදාළ අනුපාතය යටතේ රඳවා ගැනීමේ බදු අඩු කළ යුතුය.

- පොලී හෝ වට්ටම් ගෙවීම - 5%
- සමස්ථ ගෙවීම මසකට රු. 100,000 ක් හෝ ඊට වැඩි පුද්ගලයෙකුට කරන කුලී ගෙවීම සම්පූර්ණ මුදලින් - 10%
- ලාභාංශ ගෙවීම - 15%
- ලාභාංශ හැර අනෙකුත් සියලු ගෙවීම් – 14% (අය කිරීම්, ස්වභාවික සම්පත් ගෙවීම, රාජ්‍ය භාග, අධිමිල)
- සේවා ගාස්තු ගෙවීම - ගෙවන අගයෙන් 5% ක්,
    - විභාග ඉගැන්වීම්, දේශන පැවැත්වීම්, පරීක්ෂා කිරීම හෝ අධීක්ෂණය කිරීම සඳහා
    - නේවාසික රක්ෂණයකට කොමිස් හෝ තැරැව් ගාස්තු ලෙස, විකුණුම් හෝ කැන්වසින් නියෝජිතයෙකුට
    - වෛද්‍ය, ඉංජිනේරු, ගණකාධිකාරී, නීතීඥ, මෘදුකාංග සංවර්ධක, පර්යේෂක, ශාස්ත්‍රීය හෝ ඕනෑම පුද්ගල සේවා සපයන්නා නියම කළ හැකි පරිදි, එවැනි ස්වාධීන සේවා සපයන්නෙකුගේ ධාරිතාවයෙන් පුද්ගලයෙකු විසින් සපයනු ලබන සේවාවන් සඳහා

(කෙසේ වෙතත්, මසකට රු. 100,000 නොයික්ම වන සේවා ගෙවීමක් සඳහා අඩු කිරීමට අදාළ නොවේ.)

**- 125 පිටුව -**

### 6.2.1.6 ප්‍රාග්ධන ලාභ බදු අනුපාතය - 10% (සමාගම් සඳහා 30%)

- 138 පිටුව -

**පහත සඳහන් පුද්ගලයන් එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි විය යුතුය.**

*පහත කොටස පහත පරිදි සංශෝධනය කර ඇත.*

වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රැකියාවක් පවත්වා ගෙන යනු ලබන ඕනෑම තැනැත්තෙකුගේ බද්දට යටත් භාණ්ඩ හෝ සේවා සැපයුම්වල වටිනාකම වර්ෂයකට රුපියල් මිලියන 80 ක් හෝ කාර්තුවකට රුපියල් මිලියන 20 ක් ඉක්මවයි නම් එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි විය යුතුය.

- 141 පිටුව -

### 7.1.2.3.1 අනිවාර්ය ලියාපදිංචිය (10 වගන්තිය)

*පහත කොටස පහත පරිදි සංශෝධනය කර ඇත.*

| | 2019.12.31 දින දක්වා | 2020.01.01 දින සිට 2022.09.30 | 2022.10.01 සිට |
|---|---|---|---|
| මාස 03 ක බදුවන කාලපරිච්ඡේදය | රු. මිලියන 3 | රු. මිලියන 75 | රු. මිලියන 20 |
| මාස 12 ක බදුවන කාලපරිච්ඡේදය | රු. මිලියන 12 | රු. මිලියන 300 | රු. මිලියන 80 |

- 147 පිටුව -

*පහත කොටස පහත පරිදි සංශෝධනය කර ඇත.*

**බදු අනුප්‍රමාණයන් (2, 7 සහ 22 වැනි වගන්ති)**

අපනයන මත (7 වන වගන්තිය) - 0%

සම්මත අනුප්‍රමාණය (2021.10.01 සිට) - 15%

- 151 පිටුව -

*පහත කොටස පහත පරිදි සංශෝධනය කර ඇත.*

**නිමවුම් බද්ද**

සාමාන්‍ය අනුප්‍රමාණය මත සැපයුම 15%

- 163 පිටුව -

*පහත කොටස 7 පරිච්ඡේදය අවසානයට අලුතෙන් එක් කර ඇත.*

## 7.11 2022 අංක 25 දරණ සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත ක්‍රියාත්මක කිරීම

**1. පැනවීම**

2022 අංක 25 දරණ සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත මගින් 2.5% ක බදු අනුප්‍රමාණයෙන් සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද 2022 ඔක්තෝබර් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පනවනු ලැබේ.

**2. බැඳියාවේ විෂය පථය (2 වන වගන්තිය)**

පහත දක්වා ඇති සෑම තැනැත්තෙකුම සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ගෙවිය යුතුය.

(අ) යම් ද්‍රව්‍යයක් ආනයනය කරනු ලබන

(ආ) යම් ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් කරනු ලබන

(ඇ) ඕනෑම ස්වභාවයකට අයත් සේවාවක් සැපයීමේ ව්‍යාපාරයක් කරනු ලබන හෝ

(ඈ) (ආ) ඡේදයේ විධිවිධාන අදාළ වන පරිදි නිෂ්පාදකයෙකු වන්නා වූ තැනැත්තෙකු විසින් සිදු කරන විකිණීමක් හැර, යම් ද්‍රව්‍යයක් ආනයනය කිරීම සහ විකිණීම ඇතුළු එවැනි ද්‍රව්‍යයක තොග හෝ සිල්ලර ව්‍යාපාරයක් කරනු ලබන.

## 3. ලියාපදිංචි වීම (4 වන වගන්තිය)

යම් ද්‍රව්‍යයක් ආනයනය කරන තැනැත්තෙකු හැර බදු අය කළ හැකි සෑම තැනැත්තෙකුම (2වන වගන්තියේ දක්වා ඇති) ලියාපදිංචි වීම අවශ්‍ය වේ.

තම පිරිවැටුම දැනටමත් රුපියල් මිලියන 120 ඉක්මවන තැනැත්තන්

| | |
|---|---|
| නිදහස් කර ඇති ද්‍රව්‍ය සහ සේවාවන් මගින් වන පිරිවැටුම හැර සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත ක්‍රියාත්මක වන දිනට වහාම පෙරාතුව මාස දොළහක් ඇතුළත සමුච්චිත පිරිවැටුම රු. 120,000,000/- ඉක්මවන්නේ නම්, | සමාජ ආරක්ෂණ බදු පනත ක්‍රියාත්මක වන දින සිට දින පහළොවකට නොඅඩු කාල පරිච්ඡේදයක් තුළ |

උදා: 2021.10.01 සිට 2022.09.30 දක්වා කාල පරිච්ඡේදය සඳහා පිරිවැටුම (මුළු පිරිවැටුම - නිදහස් කළ ද්‍රව්‍ය හෝ සේවා මගින් වන පිරිවැටුම) රුපියල් මිලියන 120 ඉක්මවන්නේ නම්, එවැනි තැනැත්තෙකු 2022 ඔක්තෝම්බර් මස 15 වන දින හෝ ඉදිනට පෙරාතුව ලියාපදිංචි විය යුතුය.

(i) වෙනත් තැනැත්තෙකු

| | |
|---|---|
| වෙනත් යම් තැනැත්තෙකු සඳහා කාර්තුවකට රු. 30,000,000/- | ඉහත (i) වන අයිතමය යටතට නොවැටෙන තැනැත්තෙකු නම් කාර්තුවකට රුපියල් මිලියන 30 ඉක්මවන දින සිට දින පහළොවකට නොඅඩු කාල පරිච්ඡේදයක් තුළ |

## 4. සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ගෙවීම (17 වන වගන්තිය)

ස්ව-තක්සේරු පදනම මත ත්‍රෛමාසික වාරික ලෙස සමාජ ආරක්ෂණ බද්ද ගෙවිය හැකිය. ගෙවීම සිදුකිරීමට නියමිත දිනයන් පහත දැක්වේ.

**ගෙවීම් සිදුකිරීමට නියමිත දිනයන්**

| වාරිකය | ගෙවිය යුතු දිනය |
|---|---|
| පළමු වාරිකය | අදාළ කාර්තුවේ දෙවන මාසයේ 20 වන දිනට හෝ එදිනට පෙර පළමු මාසය සඳහා නියමිත බද්ද ගෙවිය යුතුය. |
| දෙවන වාරිකය | අදාළ කාර්තුවේ තුන්වන මාසයේ 20 වන දිනට හෝ එදිනට පෙර දෙවන මාසය සඳහා නියමිත බද්ද ගෙවිය යුතුය. |
| තුන්වන වාරිකය | එකී අදාළ කාර්තුව අවසානයේ ඉන් ඉක්බිතිව එළඹෙන මාසයෙහි 20 වන දින හෝ එදිනට පෙර තුන්වන මාසය සඳහා නියමිත බද්ද ගෙවිය යුතුය. |

සමාජ ආරක්ෂණ දායකත්ව බද්දට ලියාපදිංචි වූ පසුව, ලියාපදිංචිය සඳහා පිරිවැටුම් සීමාව නොසලකා සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ගෙවිය යුතුය.

## 5. බද්දට යටත් පිරිවැටුම (දෙවන උපලේඛණය)

| | විස්තරය | බද්දට යටත් පිරිවැටුම |
|---|---|---|
| (i) | යම් ද්‍රව්‍යයක් ආනයනය කිරීම (රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් අය කරනු ලබන) | ආනයන වටිනාකමෙන් 100% |
| (ii) | යම් ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීම | පිරිවැටුමෙන් 85% |

| | | | |
|---|---|---|---|
| | | (අ) මූල්‍ය සේවා සැපයීම | මූල්‍ය සේවාවන්ට ආරෝපණය වන එකතු කළ අගයෙන් 100% |
| (iii) | සේවා සැපයීම | (ආ) ඉඩම් හා වැඩිදියුණු කිරීම් | පිරිවැටුමෙන් 100%** |
| | | (ඇ) (අ) සහ (ආ) අයිතමයන්ට අදාළ නොවන සේවා | පිරිවැටුමෙන් 100% |
| | | (අ) යම් භාණ්ඩ ශ්‍රී ලංකාවේදී නිෂ්පාදනය කරන්නෙකු හෝ නිපදවන්නකුට අදාළ ලියාපදිංචි බෙදාහරින්නෙකු**** විසින් යම් ද්‍රව්‍යයක් විකිණීම | පිරිවැටුමෙන් 25% |
| (iv) | තොග සහ සිල්ලර වෙළඳාම*** | (ආ) ආනයනය කිරීම සහ විකිණීම ඇතුළුව ඉහත (අ) අයිතමයට අදාළ නොවන තොග වෙළඳාම හෝ සිල්ලර වෙළඳාම | පිරිවැටුමෙන් 50% |

* 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25ඇ වගන්තිය යටතේ නිකුත් කර ඇති ගැසට් නිවේදනයේ නිශ්චය කර ඇති ආරෝපණය කළ හැකි ක්‍රමවේදය අදාළ කර ගනිමින් කරනු ලබන මූල්‍ය සේවාවන්ට ආරෝපණය කළ හැකි එකතු කළ අගය

** පිරිවැටුම - විකුණුම් අගය - විකුණුම් දිනයට හිස් ඉඩමේ වෙළඳපොළ වටිනාකම

*** තොග සහ සිල්ලර වෙළඳාම යටතට පහත ගනුදෙනු ද අයත් වේ.

- මිලට ගැනීම සහ විකිණීම
- ආනයනය සහ විකිණීම
- නිපදවීම (Produce) සහ විකිණීම (නිෂ්පාදනය කිරීම (manufacture) හා විකිණීම ඇතුළත් නොවේ.)

**** ලියාපදිංචි බෙදාහරින්නා යන්නෙන්, ශ්‍රී ලංකාවේ යම් භාණ්ඩ නිෂ්පාදකයෙකු හෝ නිපදවන්නකු සම්බන්ධයෙන් වන විට, කලින් කලට එම භාණ්ඩ නිෂ්පාදනය හෝ නිපදවන්නා විසින් නිශ්චය කරනු ලැබිය හැකි මිලකට, එම භාණ්ඩ තොග වෙළඳපොලේ විකිණීම සඳහා එම නිෂ්පාදකයා හෝ නිපදවන්නා විසින් පත් කරනු ලබන යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් අදහස් වේ.

## 6. සමාජ ආරක්ෂණ බදු වාර්තා භාරදීම (8 වන වගන්තිය)

වාර්තා භාරදීම සඳහා නියමිත දිනය: අදාළ කාර්තුව අවසානයේ එළඹෙන මාසයෙහි 20 වන දින හෝ එදිනට පෙර

- එම කාර්තුවේදී එකී තැනැත්තා විසින් දරන ලද යම් බොල්ණයක්
- එම අදාළ කාර්තුව සඳහා ගෙවන ලද 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනත යටතේ වූ යම් එකතු කළ අගය මත බද්දක්
- අමාත්‍යවරයා විසින් අනුමත ක රන ලද යම් ජාත්‍යන්තර ඉසව්වක් සම්බන්ධයෙන් අපනයනය සංවර්ධන ප්‍රදාන යටතේ ගෙවන ලද යම් ප්‍රදානයක්

යම් අදාළ කාර්තුවක් තුළ ආපසු අය කර ගන්නා ලද යම් බොල් ණයක්, එසේ ආපසු අය කරගත් කාර්තුවේ පිරිවැටුම සඳහා ඇතුළත් කරනු ලැබිය යුතුය.

## 8. බදු බැර සහ ආපසු ගෙවීමේ ක්‍රමවේදය (36 වන වගන්තිය)

යෙදවුම් බැර හෝ ආපසු ගෙවීමේ ක්‍රමවේදයක් පනතෙහි නොමැත. කෙසේ වෙතත් යම් කාර්තුවක් සඳහා යම් තැනැත්තෙකු ගෙවීමට බැඳී සිටින ප්‍රමාණය ඉක්මවා බද්දක් හෝ දණ්ඩනයක් එකී තැනැත්තා විසින් ගෙවා ඇත්නම් අදාළ කාර්තුවට ඉන් ඉක්බිතිව එළඹෙන ඕනෑම කාර්තුවක් සඳහා සිදු කර ඇති අත්තිකාරම් ගෙවීම් ලෙස සළකනු ලැබේ.

**9. අනුකූල නොවීම සඳහා වන දණ්ඩණ**

(අ) නියමිත කාලසීමාව තුළ ලියාපදිංචි වීම සඳහා අයදුම් කිරීමට අපොහොසත් වීම - රු. 25,000/- නොඉක්මවන දණ්ඩනයක්

(ආ) වාර්තාවක් සැපයීමට අපොහොසත් වීම - රු. 50,000/- නොඉක්මවන දණ්ඩනයක්

(ඇ) ගෙවීම් පැහැර හැරීම

(අ) ගෙවීම් පැහැර හැරිය ප්‍රමාණයෙන් 10% න් සහ

(ආ) ගෙවීම් බැහැර හරින ලද සෑම අතිරේක මාසයක් සඳහා අතිරේක 2% ක්

දණ්ඩන ලෙස ගෙවිය යුතු මුදල, ගෙවීම් පැහැර හැර ඇති බදු ප්‍රමාණයෙන් 100% ක් නොඉක්මවිය යුතුය.

**10. ලියාපදිංචිය අවලංගු කිරීම (5 වන වගන්තිය)**

පහත අවස්ථාවන්හිදී, ලියාපදිංචි වූ තැනැත්තන් විසින් ලියාපදිංචි වූ දින සිට මාස දොළහක කාල පරිච්ඡේදයක් ඉක්මවීමෙන් පසුව, ඕනෑම අවස්ථාවක සිය ලියාපදිංචිය අවලංගු කරගැනීම සඳහා අයදුම්පත්‍රයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ හැකිය.

- ලියාපදිංචි වූ තැනැත්තා 2 වන වගන්තියේ දක්වා ඇති ව්‍යාපාරය නවතා දමා ඇති අවස්ථාවක දී
- එවැනි ලියාපදිංචි වූ තැනැත්තෙකුගේ සමුච්චිත පිරිවැටුම අදාළ කාර්තුවට පෙරාතුවම වූ එක් එක් කාර්තු හතර තුළදී රුපියල් මිලියන එකසිය විස්ස නොඉක්මවන අවස්ථාවක දී

# සංස්ථාපිත හා පුද්ගලික බදුකරණය

**විෂය අංකය : 304**

**2022/2023 තක්සේරු වර්ෂය සඳහා යාවත්කාලීන කිරීම්**

ප්‍රකාශනය:

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය